# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1290 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 08/08/2024 පැය 0700

# මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - පෝද්දල පොලිස් වසම.**

2024.08.07 වන දින රාත්‍රී කාලයේ පෝද්දල පොලිස් වසමේ බලගොඩ ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත පෝද්දල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු කරාපිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ බලගොඩ, පෝද්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් මත මෙම ඝාතනය සිදුකර ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනය සිදුකළ සැකකරු හඳුනාගෙන ඇති අතර, අත්අංඩංගුවට ගැනීම සඳහා පෝද්දල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.08.08 වන අද දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර ඩුබායි සිට ගුවන් මගින් නීති විරෝධී ලෙස **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 28400 ක් (කාටූන් 142) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන කලබුලුලන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.07 වන දින සවස් කාලයේදී වෙරළබඩ පොලිස් වසමේ රත්නම් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 153 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වන රත්නම් පාර, කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.07 වන දින රාත්‍රී කාලයේදී කිරුළපන පොලිස් වසමේ හේනමුල්ල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 520 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**